සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

අවධානය යොමු කළ යුතු කරුණු

- සියලුම ප්‍රශ්නවලට ඔබට ලබා දී ඇති පිළිතුරු අතරින් ඉතාම නිවැරදි පිළිතුරු අංකය මත `x' සලකුණු කරන්න.

01 සුළු ෂිර්ක්වලට අන්තර්ගත නොවන කරුණු,

1. අල්ලාහ් වෙත බොරු දිවිරීම් කිරීම
2 ජේන බැලීම
3. පිළිමවලට මල් තැබීම
4. වශී කිරීම

02 "අර්-රූහානියියාත්" හි අන්තර්ගත වන විශ්වාසය සබැඳි කරුණු,

1. අල්ලාහ් පිළිබඳ විශ්වාස කළ යුතු කරුණු
2. ආගම් පිළිබඳ විශ්වාස කළ යුතු කරුණු
3. භෞතික ලෝකයට හා ඉන්ද්‍රියන්ට ගෝචරය නොවන කරුණු
4. පරමාන්ත දිනය පිළිබඳ විශ්වාස කළ යුතු කරුණු

03 මුස්ලිම්වරයෙකු ඉටු කළ යුතු සේවාවන් අතරින් "ඉමාරත්" යන්නෙන් අදහස් කරන්නේ,

1. භූමිය සක්‍රිය කිරීම
2. අල්ලාහ්ව නැමදීම
3. අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම
4. ලොව පාලනය කිරීම

04 නබි (සල්) තුමා තමන් "ආකිබ්" යනුවෙන් හඳිසයක සඳහන් කර ඇත. ඒ තුළින් අදහස් කරන්නේ,

1. විනාශ කර දමන්නා
2. අවසානය
3. එක්රැස් කරන්නා
4. කන්නලව් කරන්නා

05 තමන් සිදු කරනු ලබන යහපත් අයහපත් සියල්ලටම හේතුව අල්ලාහ්ම පමණි යන්නෙන් පවසන කණ්ඩායම,

1. ජබරියියා
2. කද්රියියා
3. මුර්ජියා
4. මුඃතසිලා

06 මූලික නැමදුම් අනිවාර්ය කරන ලද අරමුණු පිළිබඳව අල්කුර්ආනය සාකච්ඡා කරයි. එම අරමුණක් නොවන්නේ,

1. දේව බිය ඇති කර ගැනිම
2. අල්ලාහ්ට සමීප වීමටය
3. දේව තෘප්තිය ලබා ගැනීමට
4. ලෝ වැසියන්ගේ ගරුත්වය ලබාගැනීමට

07. ෆර්ලු අයින් ගණයෙහිලා දෛනික ජීවිතයට අදාළ ඉබාදතයකි,

1. ඉගෙනීම් කටයුතුවල නිරත වීම
2. දෙමාපියන්ට උපකාර කිරීම
3. රෝගීන් බැහැ දැකීම
4. ව්‍යාපාර කිරීම

08. රුපියල් ලක්ෂ 30ක් වසරක් පුරා එක්රැස් කළ සිටි මුස්ලිම්වරයෙකු ගෙවිය යුතු සදකාත් ප්‍රමාණය වන්නේ,

1. 75000/-  2. 27500/-  3. 17500/-  4. 50 000/-

09. හජ් වාජිබ්හි අන්තර් ගතවන ක්‍රියාවක් වන්නේ,

1. "සඊයු' ඉටු කිරීම
2. දුල්හජ් 9වන දින රාත්‍රියේ මිනාවේ රැඳීම
3. දුල්හජ් 10වන දින ජමරතුල් අකබාවේ ගල් විසි කිරීම
4. නියියත් මුවින් ප්‍රකාශ කිරීම

10. "අ" කොටසේ තොරතුරුවලට "ආ" කොටසේ තොරතුරු ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුරු වන්නේ,

| "අ" | ආ |
|---|---|
| 1. හිස කෙස් ඉවත් කිරීම | A වාජිබ් |
| 2. ජම්රාවල ගල් ගැසීම | B මුභරමාත් |
| 3. තවාෆුල් කුදුම් ඉටු කිරීම | C ෆර්ලු |
| 4. නියියතයට පසු සුවඳ තැවරීම | D ෂර්ත් |
| 5. හජ් ඉටු කරන්නා මුස්ලිම් වීම | E සුන්නත් |

1. CAEBD  2. ACEBD  3. DAEBC  4. CEABD

11. "ඉඛ්ලාස්" යන පදය මගින් හැඟෙන්නේ,

1. පිළිවෙත් සුරැකීම  2. පිරිසිදු චේතනාව
3. ඇල්මක් නොමැති ජීවිතය  4. භාර ගැනීම

12. "වරඋ" යන පදයෙන් අදහස් කරන්නේ,
1. භාර ගැනිම  2. ඇල්මක් නොමැති බව
3. නොකෙළෙස් සිතුවිලි  4. පිළිවෙත් සුරැකීම

13. පහත සඳහන් අරාබි වචන අතරින් මිනිසාගේ "බාහිර පෙනුම" හඳුන්වන පදය වන්නේ,
1. හුලුක්  2. හුස්න්  3. හුදුම්  4. හල්ක්

14. "වහී මත්ලු" යන්නට උදාහරණ වන්නේ,
1. ඉබ්රාහීම් නබි තම පුතා වන ඉස්මාඊල් නබි තුමාව කුර්බාන් කරන ලෙස දුටු සිහිනය
2. මූසා (අලෛ) තුමා ඊජිප්තුවේ සිට නැවත එන විට සවන් දුන් අමුතු හඬ
3. මුහම්මද් (සල්) තුමා ඉදිරිපත් කළ හදීස්
4. මුහම්මද් (සල්) තුමා හිරා ගුහාවේ දී ලබා ගත් ප්‍රථම වාක්‍ය

15. අල්කුර්ආනයේ "තර්තීබුන් නුසුල්" යන්නෙන් අදහස් කරන්නේ,

1. පාරායනය කරන පිළිවෙළ
2 ක්‍රමයෙන් පහළ වූ පිළිවෙළ
3. ලියා තැබූ පිළිවෙළ
4. කට පාඩම් කළ පිළිවෙළ

16. ඉජ්මා වර්ග අතරින් නිහඬ ඉජ්මා හඟවන පදය,

1. ඉජ්මාඋස් සුකූති
2. ඉජ්මාඋල් කව්ලි
3. ඉජ්මාඋල් අක්සරියියා
4. ඉජ්මාඋස් සරීහ්

17. "අෂ්-ෂරායිඋස් සාබිකා" යන සහය මූලාශ්‍රය වන්නේ,

1. හුරු පුරුදු
2. සහාබිවරුන්ගේ අදහස්, තීරණ
3. සංසන්දනය කර තීන්දු ගැනීම
4. පෙර නබිවරුන්ගේ ෂරීආ

18. හදීස් ගොනු කිරීමට උනන්දු කරන ලද කලීෆා කවුරුන්ද?

1. උමර් (රළි) තුමා
2. උමර් ඉබිනු අබ්දුල් අසීස් (රහ්)
3. උස්මාන් (රළි) තුමා
4. අලි (රළි) තුමා

19. "අස්සිහාහුස් සිත්තා" නම් හදීස් ග්‍රන්ථ හයට අන්තර්ගත නොවන්නේ,

1. සුනන් අබූදාවූද්
2. තාරකුද්නි
3. සුනන් නසාඊ
4. ජාමිඋත් තිර්මිදි

20. ඉස්ලාමයට පෙර අරාබිකරයේ දක්නට ලැබූ ගෝත්‍ර ක්‍රමයක් සමූහය තුළ දක්නට ලැබුණි. එහෙත් සඳහන් වචන අතරින් "ගෝත්‍ර" යන්න,

1. ෂඋඅබ්
2. ශෛකු
3. අසබියියා
4.කබීලා

21. හිජ්රී දින දර්ශනය හඳුන්වා දුන් කලීෆා වන්නේ,

1. අබූබකර් (රළි)
2. උමර් (රළි) තුමා
3. උස්මාන් (රළි) තුමා
4. අලි (රළි) තුමා

22. ඉපයීමට අදාළ ෂරීආ නිතිරීති තුළ යහපත් සාරධර්මවලට පටහැනි ක්‍රියාවක් වන්නේ,

1. මිශ්‍ර කිරීම
2. තන්හාව
3. කළු කඩ
4. අල්ලස

23. කෘෂිකර්මාන්තය හඳුන්වන අරාබි පදය,

1. මුසාරආ
2. මුෂාරකා
3. මුරාබහා
4. මුලාරබා

24. ව්‍යාපාරයක මූලික කරුණක් නොවන්නේ,

1. ඊජාබ්
2. කබූල්
3. ෂාහිද්
4. වෙළෙන්දා

25. යකඩ භාවිතා කරමින් තාප්ප, බැමි නිර්මාණය කරන ගොඩනැගිලි කලාවේ නියැලි නබි වශයෙන් අල් කුර්ආන් සඳහන් කරන ලද්දේ,

1. සකරියියා (අලෛ) තුමා
2. දුල්කර්නෛන්
3. කහ්ෆ් වැසියන්
4. දාවූද් (අලෛ) තුමා

26. පහත සඳහන් කාන්තාවන් අතරින් අජ්නබි වන කාන්තාව වන්නේ,

1. මවගේ සහෝදරිය	2. පියාගේ සහෝදරිය

3 පියාගේ සහෝදරයාගේ දියණිය	4. ශරීර සබැඳියාවන් පැවැත්වූ බිරිඳගේ දියණිය

27. මිනිසා සකස් කර ගත් මිනිස් අයිතින් අතරින් දැකගත නොහැකි ගුණාංගය වන්නේ,

1. කාලයට හා ස්ථානයට අනුව වෙනස් වේ	2. සමානාත්මකතාවය නොරැකේ

3. නොකඩවා ක්‍රියාත්මක වේ	4. ලේඛනවලට පමණක් සීමා වේ

28. තරුණ්‍යයේදී දැක ගත නොහැකි වන්නේ,

1. ශරීර ශක්තිය	2. සමාජයට සහයෝගය නොදැක්වීම

3. කාලය කළමනාකරණය	4. දක්ෂතා දියුණු කිරීමේ අවස්ථාව

29. තරුණ වියේදී අරාබි ව්‍යාකරණ පිළිබඳ නිපුණත්වයක් දැක්වූ ඉමාම් වන්නේ,

1. ඉමාම් බුහාරි (රහ්)	2. ඉමාම් ෂාෆි (රහ්)

3. මුහම්මද් අල් ෆාතිහ් (රහ්)	4. ෂීබවෙහි (රහ්)

30. මිනිසුන් වැඩි දෙනෙකු අලසකමක් දක්වන දායාද දෙකක් ලෙස හදීස්හි සඳහන් වන්නේ,

1. ශරීර ව්‍යායාම් හා පිරිසිදුකම	2. නිරෝගීතාවය හා විවේකය

3. විවේකය හා ආහාර	4. ආහාර හා පිරිසිදුකම

31. "තලාක් ලිආන්" යනු

1. බිරිඳව මවට සමාන කිරීමෙන් ඇතිවන දික්කසාදය,
2. බිරිඳ සමග ශාරීරික සබඳතාවක් නොපවත්වන බවට දිවුරා හයිල් හතකරකට වඩා එක් නොවීමෙන් ඇතිවන දික්කසාදය,
3. බිරිඳට දුරාචාර චෝදනා එල්ල කිරීමෙන් ඇතිවන දික්කසාදය
4. බිරිඳව නැවත ලබා ගත හැකි දික්කසාදය

32. ඉස්ලාමීය අධිරාජ්‍යයේ ප්‍රථම කලීෆා වූ අබූබකර් (රළි) තුමාගේ කාලයේ දි සිදු වූ යුද්ධය වන්නේ,

1. සිෆ්ෆීන් යුද්ධය	2. යමාමා යුද්ධය

3. කර්බලා යුද්ධය	4. කන්දක් යුද්ධය

33. කුර්ආනය පාරායනය කිරීමෙහිලා ජනයා එක්රැස් කර කුර්ආනය ආරක්ෂා කළ කලීෆා වන්නේ,

1. උස්මාන් (රළි) තුමා	2. අලි (රළි) තුමා

3. උමර් (රළි) තුමා	4. අබූබක්ර් (රළි) තුමා

34. නබි (සල්) තුමාගේ විධානයකට අකට අනුව ඉස්ලාමීය ධර්ම දූත පණිවුඩ චීනයට ගෙන ගිය මාර්ගය අතර එම පණිවුඩය ශ්‍රී ලංකාවට දුන් සහාබි වන්නේ,

1. කාලිද් ඉබ්නු බකායා
2. උක්කාසා
3. වහබ් ඉබ්නු අබි හෆ්සා
4. තමීමුල් අන්සාරි

35. ඊජිප්තුවේ රජ මුකමාකිස් වෙත නබි (සල්) තුමාගේ ධර්ම දූත පණිවුඩය ගෙන ගිය සහාබි වන්නේ,

1. හාතිබ් ඉබ්නු අබූ බල්දආ (රළි) තුමා
2. නිහියා ඉබ්නු කල්බි (රළි) තුමා
3. අම්ර් ඉබ්නු උමෛයා (රළි) තුමා
4. අබ්දුල්ලාහ් ඉබ්නු හුදෆා (රළි) තුමා

36. පහත සඳහන් වචන අතරින් සම්පතාවයක් දක්වන වචන යුගය වන්නේ,

1. සහිහ් - ලජ්ෆ්
2. කල්බුන් සලීම් - කල්බුන් මුත්මයින්නා
3. මුජ්තහිද් - මුකල්ලිද්
4. දුන්යා - ආකිරා

37. තහනම් කරන ලද ව්‍යාපාර ක්‍රියාවලිය,

1. අල්-මුලාරබා
2. අල්-මුෂාරකා
3. අල්-ඉජාරා
4. අර්-රිබා

38. මම කවුද? කොහේ සිට පැමිණියේද? මෙලොව මගේ සේවය කෙසේ සකස් විය යුතුද? යනාදි ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දෙන්නේ,

1. තීක්ෂණ බුද්ධිය
2. දැනුම
3. වහි දැනුම
4. විද්‍යාත්මක දැනුම

39. ගර්භනී මාතාවකගේ ඉද්දා කාලය වන්නේ,

1. දරු ප්‍රසූතිය දක්වා
2. මාස හතරයි දවස් දහයයි
3. කුරුළ තුනකි
4. ඉද්දා නොමැත

40. ඊජිප්තුවේ සිට ශ්‍රී ලංකාවට රටින් පිටුවහල් කරන ලද්දේ,

1. උමර් හස්රත්
2. ඔරාබි බාසා
3. කාලිද් බින් බකායා
4 ඉබ්නු බතූතා

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

අවධානය යොමු කළ යුතු කරුණු

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ප්‍රථම ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10ක් ද ලබා දෙනු ලැබේ.

කෙටි පිළිතුරු ලියන්න.

01. i. ඉස්ලාමීය අකීදාවට පටහැනි පිරිස් බිහිවීමට හේතු දෙකක් ලියන්න.

ii. ෆර්ලු කිෆායා යනු කුමක් ද? එයට උදාහරණ දෙකක් ලියන්න.

iii. කුෆ්ර් හා ඉල්හාද් අතර වෙනස පහදන්න.

iv. ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට අවශය මූලික කරුණු හතරක් ලියන්න.

v. පිළිවෙත් සුරැකීම යන්න අරාබි පදය ලියන්න.

vi. අල්-මුනාහකාත්, අල්-මුආමලාත් යන පදවල වෙනස පහදන්න.

vii. "ඉමාමුල් මදීනා" යන විශේෂ නාමය ලැබූ ඉමාම් කවුරුන්ද?

viii. "දුන්නූරෛන්" යනුවෙන් හඳුන්වනු ලැබූ සහාබි කවුරුන්ද? එසේ හඳුන්වනු ලැබීමට හේතුව කුමක් ද?

ix. නම හා සාහිත්‍ය කෙරෙහි සිද්ධි ලෙබ්බේ තුමා දායක කළ ග්‍රන්ථය කුමක් ද?

x. ව්‍යාපාරික භාණ්ඩයක් සතු විය යුතු කොන්දේසි දෙකක් ලියන්න.

02.

i. අකීදාවේ පිරිසිදුභාවය රැක ගැනීමට දායක වූ ඉස්ලාමීය විද්වතුන් සිව් දෙනෙකු නම් කරන්න.

ii. මුඃජිසාත්, කරාමත්, ඉස්මත් යන පද කුමක් හඟවන්නේද?

iii. අවසාන නබිත්වය පහදා දෙන තර්කික සාක්ෂි මොනවාද?

03.

i. ෆර්ලු අයින්, ෆර්ලු කිෆායා යන දෙකෙහි වෙනස පහදන්න.

ii. සුළු කිල්ල, මහා කිල්ල යනු කුමක් ද? ඉන් මිදෙන ආකාරය පහදන්න.

iii. දෛනික ක්‍රියාවලියක් ඉබාදත් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි මොනවාද?

04.

i. තව්බා කිරීමේ කොන්දේසි මොනවාද?

ii. ඊමානිය සුවය ලබා දෙන කරුණු තුනක් කෙටියෙන් පවසන්න.

iii. සලාතය මගින් ලැබෙන ප්‍රයෝජන මොනවාද?

05

i. නබි (සල්) තුමාගේ සීරාව ලියන ලද ප්‍රථම විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න.

ii. නබි (සල්) තුමා යුදෙව්වන් සමග සිදු කළ ගිවිසුම පිළිබඳ සඳහන් කරන්න.

iii. හුදෛබියා ගිවිසුමෙහි වැදගත්කම පහදන්න.

06

i. තරුණ වියේදී ඉස්ලාමය උදෙසා විශේෂ දායකත්වයක් දැරූ සිවුදෙනෙකු නම් කරන්න.

ii. තරුණ, තරුණියන් වළක්වා ගත යුතු කරුණු ලැයිස්තු ගත කරන්න.

iii. සිතෙහි ආරෝග්‍යභාවය ආරක්ෂා කර ගත හැකි ඉස්ලාමීය මගපෙන්වීම් සඳහන් කරන්න.

07. පහත සඳහන් කරුණු දෙකක් කෙටියෙන් පහදන්න.

i. සන්නිවේදනයෙහි තිබිය යුතු ගුණාංග පහදන්න.

ii. අරාබිය හා ශ්‍රී ලංකාව අතර සබැඳියාවක් ඇතිවීමට හේතු පහදන්න.

iii. අබුබකර් (රළි) තුමාගේ කාලයේදී කුර්ආනය ග්‍රන්ථාරූඪ කළ ඉතිහාසය පහදන්න.

iv. ඉස්ලාමීය ෂරීආ දැක්ම අනුව විවාහයේ අරමුණ පහදන්න.